Pakenham's
OPEN
FOR BUSINESS

## කාබුල් ස්පයිසස්

නව කළමණාකරනය යටතේ, මිනිසුන් නැවත ගෙන්වා ගැනීම සඳහා කාබුල් ස්පයිසස් වෙතින් පාකෙන්හම් වෙත නව සාම්ප්‍රදායික රසයන් ගෙන එයි.

33 ජෝන් ස්ට්‍රීට්, පාකෙන්හම්හි පිහිටි සැබෑ ඇෆ්ගනිස්තාන අවන්හල් හිමියන් වන මෙන්හාජ් පවුල හමුවන්න. මෙන්හාජ් පවුල ඕස්ට්‍රේලියාවට පැමිණියේ 2021 වන අතර ඔවුන් ඔවුන්ගේ ගුණාත්මක, නිවසේ පිළියෙල කරන ආහාර සඳහා ඇති ආශාව, මිත්‍රශීලී සේවාව, සහ සිය සංස්කෘතිය අන් අය සමග බෙදා හදා ගැනීමට ඇති කැමැත්ත ඔවුන් සමග රැගෙන විත් ඇත.

'මාගේ මව හොඳම ඇෆ්ගන් ආහාර පිළියෙල කරන අතර, අපට අවශ්‍ය සියළුම සංස්කෘතීන්ට ඇතුළත් අය අපගේ ආහාර රසබලා අපට උපකාර කිරීමය' යන්න ඔවුන්ගේ දියණිය වන නයිලා පැවසුවාය.

මුළු පවුලම සිය අවන්හල වෙත නව පාරිභෝගිකයන්ගේ පැමිණීම සාදරයෙන් බලා සිටින අතර සිය සංස්කෘතිය සහ ඉතාම රසවත් ආහාර භුක්ති විඳින ලෙස ඉල්ලා සිටියි. කෑම වට්ටෝරුවේ ඇති ජනප්‍රියම ආහාර වර්ග වන්නේ කබුලි පලව් (සාම්ප්‍රදායික බත්) සහ මැන්ටෝ (ඇෆ්ගන් ඩම්ප්ලිංග්) ය.

'දුම්රිය හරහා දිවෙන පාරවල් ඉවත්කරන ව්‍යාපෘතියේ සේවය කරන අය ඇතුළු, නව මුහුණු ගණනාවක් දැකීමට ලැබීම සතුටට කාරණාවකි. අපට සහයෝගය දැක්වීම සම්බන්ධයෙන් ස්තුතියි,' නයිලා පැවසුවාය.

2024 වසරේ නව පාකෙන්හම් දුම්රිය ස්ථානය විවෘතවීමත් සමගම ව්‍යාපෘතිය මගින් ප්‍රජාවට කුමන දෙයක් කරයිද සහ නගරය වෙත නව පාරිභෝගිකයන්, සංස්කෘතීන් සහ ව්‍යාපාර රැගෙන එන ආකාරය බැලීමට මෙන්හාජ් පවුල උනන්දුවෙන් සිටී.

පාකෙන්හම්හි වර්ධනය වන ප්‍රජාවට ආහාර සැපයීම සඳහා සුවපහසු ආකාරයට නිවසේ සෑදූ ආහාර සඳහා හොඳම ස්ථානය කාබුල් ස්පයිසස්වේ.

**33 ජෝන් ස්ට්‍රීට්, පාකෙන්හම් හි කාබුල් ස්පයිසස් වෙත යන්න.**



කාබුල් ස්පයිසස් හි නයිලා සහ ඇයගේ පියා

# රථවාහන සම්බන්ධ වෙනස්කම්

සමහර අවස්ථාවල අප මාර්ග සහ වීදි තාවකාලිකව වසා තබනු ඇත. බලපෑම් ඇතිවූ වැසියන් සහ වෙළෙඳුන් හට රථවාහන සම්බන්ධ වෙනස්වීම් සිදුවන විට දැනුම් දෙනු ඇත.

### රයන් රෝඩ්හි වැඩ කරටුතු

නව ඊස්ට් පාකෙන්හම් දුම්රිය ස්ථානයේ ඉදිකිරීම් සිදුවන අතර රයන් රෝඩ්හි නියාමන සහ නඩත්තු කටයුතු දිගටම සිදුවනු ඇත.

### හෙන්ට්ලි ස්ට්‍රීට් වැඩ කටයුතු

හෙන්ට්ලි ස්ට්‍රීට් ඊස්ට්බවුන්ඩ් ලේන් 2023 මැද වනතෙක් වසා තබනු ඇත. ඔබ ගමන් කරන ආකාරයට රථවාහන මාර්ග කළමණාකරණ වෙනස්කම් සිදුවනු ඇත.

ප්‍රජාවගේ සහ කාර්ය බලකායේ ආරක්ෂාව සඳහා ව්‍යාපෘති ප්‍රදේශයේ ගමන් කරන විට කරුණාකර රථවාහන කළමණාකරණයේ මාර්ග වෙනස් කරන සංඥා පුවරු සහ උපදෙස් පිළිපදින්න. පහත සිතියම බලන්න.

### සැවේජ් ස්ට්‍රීට්හි මිනිසුන් පාර හරහා යාම

පාකෙන්හම් සාප්පු සංකීර්ණය වෙත පාර හරහා යන ප්‍රවේශය සැවේජ් ස්ට්‍රීට් පාර හරහා යාම ඔස්සේ ප්‍රවේශය ලබා දෙනු ඇත.

සමහර අවස්ථාවල, මිනිසුන් පාර හරහා යාම නැවැත්වීමට අපට සිදුවනු ඇත.

පළාත්වාසීන් සඳහා ෂටල් සේවාවක් ලබාදෙනු ඇත.




## ව්‍යාපෘති කාලවකවානු

**2020**
- බිම් ගවේශණය
- තාක්ෂණික සහ ඉංජිනේරු ඇගයීම්
- ප්‍රජා සහභාගීත්වය

**2021 මුල් භාගය**
- ප්‍රජා සහභාගිත්වය
- වැඩිදුර ඉංජිනේරු සහභාගිත්වය

**2021 මැද භාගය**
- දුම්රිය ස්ථාන සැලසුම් නිවේදනය කිරීම

**2021 අග භාගය**
- විවෘත අවකාශ සම්බන්ධ ප්‍රජා සහභාගිත්වය
- කල්තියා කරන වැඩ කටයුතු

**2022**
- ඉදිකිරීම

**2023**
- ඉදිකිරීම

**2024**
- වැඩි යහපත සඳහා බූම් ගේට් ඉවත්ව යාම
- පාකෙන්හම් සහ ඊස්ට් පාකෙන්හම් දුම්රිය ස්ථාන විවෘත කිරීම
- පළාත්වාසීන් හට භුක්තිවිඳීම සඳහා ප්‍රජා අවකාශ විවෘත කිරීම

*කාලවකවානු වෙනස්වීම්වලට යටත්වේ



පාකෙන්හම් දුම්රිය ස්ථානයේ හාර්ඩ්ස්ටෑන්ඩ් ඉදිකිරීම් කටයුතු

## සම්බන්ධවී සිටීම

යාවත්කාලීනව සිටීම සඳහා ඊමේල් යාවත්කාලීන සඳහා **levelcrossings.vic.gov.au/subscribe** වෙත ගොස් අනුසන් කර පාකෙන්හම් දුම්රිය හරහා වන පාරවල් ඉවත් කිරීමේ ව්‍යාපෘතියට අත්සන් කරන්න.

ඔබට කිසියම් ප්‍රශ්නයක් ඇතිනම්, හෝ වැඩිදුර විස්තර සවශ්‍ය නම්, දුරකථන අංක 1800 105 105 අමතන්න, නැතිනම් දිනයේ පැය 24 පුරා සහ සතියේ දින 7 පුරා **contact@levelcrossings.vic.gov.au** 24 වෙත ඊමේල් කරන්න.

අපව සමාජ මාධ්‍යවල ලුහුබඳින්න නැතිනම් අපගේ ෆේස්බුක් පිටුවෙන් පුද්ගලික පණිවුඩයක් එවන්න.

ඉදිකිරීමේ සෑම අදියරක් සම්බන්ධයෙන්ම ඔබව දැනුවත් කිරීම සඳහා ප්‍රජාව සහ දුම්රිය මගීන් සමග එක්ව කටයුතු කරන ඇපකැපවූ කණ්ඩායමක් අප සතුව සිටී.

**අපගේ වැඩ කටයුතු සම්බන්ධව යාවත්කාලීනව සිටින්න**

පාකෙන්හම් දුම්රිය හරහා දිවෙන මාර්ග ඉවත් කිරීමේ ව්‍යාපෘතිය සම්බන්ධ යාවත්කාලීනයන් SMS මගින් ලබා ගැනීම සඳහා අනුසන් කිරීමට QR කේතය ස්කෑන් කරන්න නැතිනම් **PAKENHAM** යනුවෙන් **0428 581 917** අංකයට ටෙක්ස්ට් පණිවුඩයක් යවන්න.





රේල් පීලි ඇදගෙන යාම සඳහා ඊස්ට් පාකෙන්හම්හි රේල් එස්කැවේටර සූදානමින් සිටීම

SINHALESE

LEVEL CROSSING REMOVAL PROJECT

# දුම්රිය හරහා යන පාර ඉවත්කිරීම සම්බන්ධ යාවත්කාලීන

පාකෙන්හම්
2022 සැප්තැම්බර්

## පාකෙන්හම්හි වැඩ කටයුතු සිදුවන අයුරු

පාකෙන්හම්හි මැක්ග්‍රෙගර් රෝඩ්, මේන් ස්ට්‍රීට්, සහ රේස්කෝර්ස් රෝඩ්හි ඇති භයානක සහ ජනාධික දුම්රිය හරහා දිවෙන පාරවල් අප විසින් ඉවත් කරන අතර පාකෙන්හම් සහ ඊස්ට් පාකෙන්හම්හි අප විසින් නව දුම්රිය ස්ථාන ඉදිකරනු ඇත. වික්ටෝරියානු රජය මගින් පාකෙන්හම් මාර්ගයේ ඇති දුම්රිය හරහා දිවෙන පාරවල් 22 ක් ඉවත්කර 2025 වනවිට එය බූම් ගේට්ටු නැති කිරීම සඳහා මෙම දුම්රිය හරහා දිවෙන පාරවල් ඉවත් කිරීම කඩිනම් කර ඇත.

හාර්ඩ්ස්ටෑන්ඩ් සහ පයිලිං වැඩ සහිත කිලෝමීටර 2.5 ක් දිග දුම්රිය පාලම සඳහා අවශ්‍ය අත්තිවාරම ඉදිකිරීම අප විසින් ආරම්භ කර ඇත. හාර්ඩ්ස්ටෑන්ඩ් වැඩ මගින් ඉදිකිරීම් බිම, බර යන්ත්‍රෝපකරණ යාම සඳහා පිළියෙල කරන අතර පයිලිං වැඩ මගින් නව රේල් පාලමට අවශ්‍ය ශක්තිමත් අත්තිවාරමක් සඳහා අවශ්‍ය යටි බිම් ඩ්‍රිලිං කටයුතු සිදු කරනු ඇත. මෙම වැඩ කටයුතු මැක්ග්‍රෙගර් රෝඩ් සහ රයන් රෝඩ් දුම්රිය කොරිඩෝරය ඔස්සේ 2023 මැද භාගය වන තෙක් සිදු කරනු ඇත.

පයිලිං මගින් මෙම වසරේ සහ මීළඟ වසර තෙක් ඔසවන ලද දුම්රිය පාලම පිහිටුවීමට අවශ්‍ය කටයුතු කිරීමට උපකාර කරනු ඇත.

පාකෙන්හම්හි ඇති දුම්රිය හරහා දිවෙන පාරවල් තුනම ඉවත් වන අතර මෙල්බර්න්හි වැඩිපුරම ජනාකීර්ණ දුම්රිය මාර්ගය වඩා වේගවත් වන අතර පළාතේ පාරවල් වඩා අරක්ෂාකාරී වනු ඇත.

### මෙම දුම්රිය හරහා දිවෙන පාරවල් ඉවත් කිරීමට අවශ්‍ය හේතුව


- සෑම සතියේ දිනකම **වාහන 63,000 ක්** මෙම දුම්රිය හරහා දිවෙන පාරවල් භාවිතා කරයි
- උදෑසන වඩාත්ම වාහන තදබදය ඇති අවස්ථාවල **මිනිත්තු 30 කට වඩා** මෙම බූම් ගේට්ටු වසා තබයි
- දිනපතා 170 **මෙට්රෝ සහ වී/ලයින් දුම්රිය** මෙම දුම්රිය හරහා දිවෙන පාරවල් පසු කරයි
- දිනපතා **මගීන් 90,000 ක්** ක්‍රෙන්බර්න්-පාකෙන්හම් මාර්ගය භාවිතා කරයි

# ඉදිකිරීම් ආරම්භ කර ඇත

මෙම ශීත ඍතුවේදී අපි පාකෙන්හම්හි ප්‍රධාන ඉදිකිරීම් ආරම්භ කළෙමු. සේවක පිරිස් ඉහළින් යන විදුලි වැඩ කටයුතු, පැරණි රේල්පීලි සහ දුම්රිය මාර්ග ඉවත් කිරීම, නව කේබල් ස්ථාපනය කිරීම සහ නව ඊස්ට් පාකෙන්හම් දුම්රිය ස්ථානය වැඩබිමේ පිළියෙල කිරීම් දිගටම සිදු කිරීම දුම්රිය කොරිඩෝරයේ පැය 24 පුරා සිදු කරන ලදී.

වැඩබිමෙහි විශාල ප්‍රගතියක් ඇත. මෙම කරුණු පරීක්ෂා කර බලන්න.

- දුම්රිය මාර්ගයට යටින් නව බැලස්ට් සහ පස් ටොන් 5000 ක් අළුතින් යොදන ලදී
- ලී සිල්පර 1600 ක් ඉවත් කළ අතර කොන්ක්‍රීට් සිල්පර 250 ක් ප්‍රතිචක්‍රීය කරන ලදී
- දුම්රිය මාර්ගය දෙපස නව වැටවල් මීටර් 800 ක් ස්ථාපනය කරන ලදී
- වෙනත් දුම්රිය මාර්ගයකට ඉඩදීමට තිබූ කිමී 2.5 ක් ඉවත්කර ප්‍රතිචක්‍රීය කරන ලදී
- නව කේබල් කිලෝමීටර් 3 ක් ස්ථාපනය කර ක්‍රියාත්මක කරන ලදී



ඊස්ට් පාකෙන්හම්හි දුම්රිය මාර්ගය යටින් බැලස්ට් සහ පස් අළුත් කිරීම




මේන් ස්ට්‍රීට් දුම්රිය හරහා දිවෙන පාරේ දුම්රිය මාර්ගය සහ සිල්පර ඉවත් කිරීම




දුම්රිය මාර්ගයේ දෙපස ඉවත් කිරීම සහ පාකෙන්හම් දුම්රිය ස්ථානයේ වැඩබිම පිළියෙල කිරීම



මැක්ග්‍රෙගර් රෝඩ් බටහිර ඉහළ වැඩ කටයුතු



දුම්රිය කොරිඩෝව දිගේ වැට බැඳීම

# ශක්තිමත් අත්තිවාරම් ගොඩනැගීම

අප විසින් පාලම ඉදිකිරීමට පෙර සෑම පාලම් කණුවක් සඳහාම ශක්තිමත් අත්තිවාරමක් ඉදිකළ යුතුය. අගෝස්තු මාසයේ මැක්ග්‍රෙගර් රෝඩ්, මේන් ස්ට්‍රීට් සහ රේස්කෝර්ස් රෝඩ්හි නව පාලම සඳහා අත්තිවාරම් ගොඩ නැගීම ආරම්භ කරන ලදී. මෙයට පයිලිං කිරීම සහ හාඩ්ස්ටෑන්ඩ් ඇතුලත්වේ.

### හාර්ඩ්ස්ටෑන්ඩ් වැඩ කටයුතු

හාර්ඩ්ස්ටෑන්ඩ් වැඩ කටයුතුවලට බර ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ සඳහා ආරක්ෂාකාරී සහ සුදුසු පෘෂ්ඨයක් ඇති කිරීම ඇතුලත්වේ. වැඩකටයුතු අතර කැණීම්, භාණ්ඩ ගෙන ඒම සහ භූමියේ ස්ථාවරබව සඳහා පස් තද කිරීම ඇතුලත්වේ.

### පයිලිං වැඩ කටයුතු


පයිල් යනු නව දුම්රිය පාලමට උපකාර කරන ගැඹුරු පොළොව යට අත්තිවාරම්වේ. පයිලිං වැඩ කටයුතු අතර පොළොව යටට සිදුරු විදීම ඇතුලත්වේ. සිදුර තුලට සිලින්ඩරාකාර යකඩ කූඩුවක් ඇතුළු කරන අතර එයට පයිලයක් ඇති කිරීම සඳහා කොන්ක්‍රීට් පුරවනු ඇත.

මැක්ග්‍රෙගර් රෝඩ් සහ රේස්කෝර්ස් රෝඩ් කොරිඩෝරය දිගේ පයිල් 74 ක් පමණ ස්ථාපනය කරනු ඇත. පයිලිං වැඩ කටයුතු සම්පූර්ණ කිරීම සඳහා විශේෂ ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ අවශ්‍ය වන අතර දෙදිරීම සහ ශබ්ද ඇතිවේ.

පයිලිං අවසන්වූ පසු, දුම්රිය පාලම සහ ඉස්සුනු ව්‍යුහයන් සැමට බලාහත හැකිවන සේ තිබෙනු ඇත.


අප විසින් දුම්රිය පාලම ගොඩනගන ආකාරය සම්බන්ධව වැඩිපුර කරුණු දැන ගැනීම සඳහා QR කේතය ස්කෑන් කර අපගේ තොරතුරු පත්‍රිකාව බලන්න.

## පයිලිං සම්බන්ධ අදියෙරෙන් අදියර මාර්ගෝපදේශයක්




### සිදුරු ඇති කිරීම

නව පාලමේ මුළු දිගට මීටර් 35 ක් ගැඹුරට කවාකාර සිදුරු ඩ්‍රිල් කිරීම. පසෙහි ස්ථාවරබව රැක ගැනීම සඳහා සිදුරු ඇතුලත දියර ගම් වර්ගයක් ආලේප කරනු ඇත.



### වානේ මගින් නැවත ශක්තිමත් කිරීම

පයිලය සුරක්ෂිත කිරීම සහ නැවත ශක්තිමත් කිරීම සඳහා සිලින්ඩාකාර කූඩුවක් ඇතුලත් කරනු ඇත.



### කොන්ක්‍රීට් පිරවීම

සිදුර තුලට කොන්ක්‍රීට් පොම්ප කර සවි වීමට ඉඩ හරිනු ඇත. සවිවූ පසු, අවශ්‍ය නියම මට්ටමට කණුව කපාගනු ඇත. කණුව මගින් නව දුම්රිය පාලමේ බර දරනු ඇත.

### නැවත කිරීම

දුම්රිය පාලමේ මුළු දිග පුරා කණු 74 වන තුරු මෙම ක්‍රියාවලිය නැවත නැවත සිදු කරනු ඇත.